# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 12,139 — 1960 ජූනි 3 වැනි සිකුරාද — 3.6.1960

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)

# III වැනි කොටස—ඉඩම්

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත)


| | | | පිට |
|---|---|---|---|
| ඉඩම් නිරවුල්කිරීම පිළිබඳ දැන්වීම් :— | | | |
| ප්‍රාරම්භක දැන්වීම් | ... | ... | — |
| අවසාන නියෝග | ... | ... | — |
| ආණ්ඩුවේ ඒජන්තවරුන් විසින් ඉඩම් විකිණීම :— | | | |
| බස්නාහිර පළාත | ... | ... | — |
| මධ්‍යම පළාත | ... | ... | — |
| දකුණු පළාත | ... | ... | — |
| උතුරු පළාත | ... | ... | — |
| නැගෙනහිර පළාත | ... | ... | — |
| වයඹ පළාත | ... | ... | — |
| උතුරු මැද පළාත | ... | ... | — |
| ඌව පළාත | ... | ... | — |
| සබරගමු පළාත | ... | ... | — |

| | | | පිට |
|---|---|---|---|
| ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරීන් විසින් ඉඩම් විකිණීම :— | | | |
| බස්නාහිර පළාත | ... | ... | — |
| මධ්‍යම පළාත | ... | ... | — |
| දකුණු පළාත | ... | ... | — |
| උතුරු පළාත | ... | ... | — |
| නැගෙනහිර පළාත | ... | ... | — |
| වයඹ පළාත | ... | ... | — |
| උතුරු මැද පළාත | ... | ... | — |
| ඌව පළාත | ... | ... | — |
| සබරගමු පළාත | ... | ... | — |
| ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම් | | ... | 243 |
| ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම් | | ... | 253 |
| ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම් | | ... | — |
| ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම් | ... | ... | 254 |
| ඉඩම් හිමි ගැමි ක්‍රමය යටතේ ඉඩම් දීම | | ... | — |


## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

අංකය : ජේ 59/60 එච් ඒ 465, ආර්/කිච්/298.

### 1954රේ අංක 39 දරන ඉඩම් ලබාගැනීමේ (සංශොධිත) ආඥපනතින් සංශොධිත 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනත

5 වැනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම් පොදු කටයුත්තකට උවමනා කර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ අඥපනතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) අඥපනතින් සංශෝධිත 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 5 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ කෘෂිකම් හා ඉඩම් පිළිබඳ ඇමතිවරයාවූ මොහොට්ටාළගේ ඩිංගිරි බණ්ඩා නමැති මම මෙයින් ප්‍රකාශකරමි.

කොළඹ දිසාවේ කොළඹ ප්‍රාදේශීය ආදායම් නිලධාරී තැනගේ කොට්ඨාශයේ කොළඹ නාගරිකය සීමාව තුළ අංක 21 දරණ සුදුවැල්ල කොට්ඨාශයේ පිහිටි ඩීන්ස් පාරේ වරිපනම් අංක 355 දරණ ස්ථානයෙන් කොටසක්වූ ප්‍රමාණයෙන් අක්කර 2, රූඩ් 0, පර්චස් 15.58 පමණවූ ඉඩම් කොටසට මායිම් වශයෙන් :—

උතුරට : ඩීන්ස් පාරේ වරිපනම් අංක 315 සහ හෙජ්ස් කෝට්හි 10, 14, සහ 18 දරණ ස්ථානයන් ; නැගෙණහිරට : සීමාසහිත ලංකා සිසිල්බීම සමාගමට අයිති ඉඩම සහ ඩීන්ස් පාරේ වරිපනම් අංක 355 දරණ ස්ථානය ; දකුණට : ඩීන්ස් පාරේ වරිපනම් අංක 355 සහ 385 දරණ ස්ථානයන්ගෙන් කොටස් (ඒ 3,682 දරණ මූලික සැලැස්මේ 1 වෙනි කැබෙල්ල) බස්නාහිරට : ඩීන්ස් පාර.

ඇම්. ඩී. බණ්ඩා,
කෘෂිකම් ඉඩම් පිළිබඳ ඇමතිතුමා.

1960 ක්වූ මැයි මස 14 වැනි දින,
කොළඹදීය.

---

අංකය : ආර්. ඒ. ඇෆ්ජ්./ඒ. 1.

### 1954රේ අංක 39 දරන ඉඩම් ලබාගැනීමේ (සංශොධිත) ආඥපනතින් සංශොධිත 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනත

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම් පොදු කටයුත්තකට උවමනා කර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ අඥපනතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශොධිත) ආඥපනතින් සංශොධිත 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 5 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ කෘෂිකම් හා ඉඩම් පිළිබඳ ඇමතිවරයා වූ මොහොට්ටාළගේ ඩිංගිරි බණ්ඩා නමැති මම මෙයින් ප්‍රකාශකරමි.

1. කොළඹ දිසාවේ උතුරු අලුත් කුරු කෝරළයේ " ඒ " කොට්ඨාසයේ දැසිය පත්තුවේ දකුණු කදිරාන නම් ගමේ පිහිටි (දැනට ගුවන් තොටුපලේ විදුලි යන්ත්‍රස්ථානයක් සඳහා ප්‍රයෝජනයට ගෙන ඇති) කදිරාන වත්තයායේ කොටසක් වන අ. 0, රූ. 2, පෑ. 0ක් පමණ විශාල කෑබැල්ලට මායිම් :—

උතුර, නැගෙනහිර, දකුණ සහ බස්නාහිරට මෙම ඉඩමේම ඉතිරි කෑබලි.

2. කොළඹ දිසාවේ උතුරු අලුත් කුරු කෝරළයේ " ඒ " කොට්ඨාශයේ දාසිය පත්තුවේ කුරන කටුනායක නම් ගම පිහිටි අ. 0, රූ. 3, ප. 09ක් පමණ විශාල දවටගහවත්ත නම් ඉඩමට මායිම් :—

උතුරට : දියහොද ඇල ; දකුණට : ඇම්. පේදුරු පෙරේරා අයිතිවාසිකම් කියන දවටගහවත්ත නම් ඉඩම ; නැගෙනහිරට : ඇම්. පේදුරු පෙරේරා සහ විනී සිල්වා යන අය අයිතිවාසිකම් කියන දවටගහවත්ත නම් ඉඩම : බස්නාහිරට : මීගමු කලපුව.

ඇම්. ඩී. බණ්ඩා,
කෘෂිකර්ම හා ඉඩම් පිළිබඳ ඇමතිතුමා.

අංකය : ජේ 57/58 ඩී. 253.
1960ක් වූ මැයි මස 12 වැනි දින.

---

අංකය : ජේ 58/59 එස් 918 ආර්/කිව් 270.

## 1954රේ අංක 39 දරන ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥපනතින් සංශෝධිත 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනත

### 5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම් පොදු කටයුත්තකට උවමනා කර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1954රේ අංක 39 දරන ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥපනතින් සංශෝධිත 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 5 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ කෘෂිකර්ම හා ඉඩම් පිළිබඳ ඇමතිවරයා වූ මොහොට්ටාලගේ ඩිංගිරි බණ්ඩා නමැති මම මෙයින් ප්‍රකාශකරමි.

කොළඹ දිසාවේ, කොළඹ ප්‍රාදේශීය ආදායම් නිලධාරී තැනගේ කොට්ඨාශයේ කොළඹ නාගරිකයේ නැගෙනහිර කොටහේන කොට්ඨාශයේ පිහිටි කොටහේනේ මේපිල්ඩ් පටුමග වරිපනම් අංක 91 දරණ තලගහවත්ත නමැති ඉඩමෙන්, ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, ප. 10.12 ක් වූ ඉඩම් කෑබැල්ලට මායිම් වශයෙන් :—

උතුරට : ඇන්. ආර්. ප්‍රනාන්දු මහත්මිය විසින් අයිතිකම් කියනු ලබන මේපිල්ඩ් පටුමග වරිපනම් අංක 93 සහ 95/3 දරණ ස්ථානයන් ; නැගෙනහිරට : මේපිල්ඩ් පටුමග ; දකුණට : ඒ. ඇල්. පෙසෝන් මහතා විසින් අයිතිකම් කියනු ලබන මේපිල්ඩ් පටුමග වරිපනම් අංක 89 දරණ ස්ථානය ; බස්නාහිරට : එස්. ඒ. ඩී. ඩබ්ලිව්. ආර්. නානායක්කාර මහත්මිය විසින් අයිතිකම් කියනු ලබන මේපිල්ඩ් පටුමග වරිපනම් අංක 91/1 දරණ තලගහවත්ත නමැති ඉතිරි ඉඩම් කෑබැල්ල.

ඇම්. ඩී. බණ්ඩා,
කෘෂිකර්ම හා ඉඩම් පිළිබඳ ඇමතිතුමා.

1960ක් වූ මැයි මස 14 වැනි දින,
කොළඹදීය.

---

අංකය : කිව්. ඒ 423/ජේ 57/58 ඇල්. 442.

## 1954රේ අඩක 39 දරණ සංශෝධිත පනතින් සංශෝධනය කළ පරිදි 1950හේ අඩක 9 දරන ඉඩම් ලබාගැනීමේ ආඥපනත

### 5 වැනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි

මෙහි පහත විස්තරකර තිබෙන ඉඩම් පොදු කටයුත්තකට උවමනා කර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1954රේ අඩක 39 දරණ සංශෝධිත පනතින් සංශෝධනය කළ පරිදි 1950හේ අඩක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 5 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ කෘෂිකර්ම හා ඉඩම් පිළිබඳ ඇමතිවරයාවූ චාල්ස් පාර්සිවල් ද සිල්වා නමැති මම මෙයින් ප්‍රකාශකරමි :

(1) කොළඹ දිස්ත්‍රික්කයේ බටහිර සියනෑ කෝරළේ (මැදපත්තුවේ) කොස්ඉන්නේ පිහිටි මිල්ලගහකුඹුර යන ඉඩමෙන් පාර්චස් 16.5ක පමණ ඇති කොටසක්. ඊට මායිම් :—

උතුරට : මෙම ඉඩමේම ඉතිරි කොටස ; නැගෙනහිරට : බස්තියාන හාමිනේ අයිතිකම් කියන දවටගහකුඹුර ; දකුණට : මහවෙල ඇල ; බස්නාහිරට : ඇස්. පීටර් අප්පුහාමි සහ තව කෙනෙක් අයිතිකම් කියන මෙම ඉඩමේම කොටසක්.

(2) කොළඹ දිස්ත්‍රික්කයේ බටහිර සියනෑ කෝරළේ (මැදපත්තුවේ) කොස්ඉන්නේ පිහිටි දවටගහකුඹුර යන ඉඩමෙන් පාර්චස් 0.5ක පමණ ඇති කොටසක්. ඊට මායිම් :—

උතුරට සහ නැගෙනහිරට : මෙම ඉඩමේම ඉතිරි කොටස් ; දකුණට : මහවෙල ඇල ; බස්නාහිරට : ඇල්පේනිස් මුණසිංහ අයිතිකම් කියන මිල්ලගහකුඹුර.

(3) කොළඹ දිස්ත්‍රික්කයේ බටහිර සියනෑ කෝරළේ (මැදපත්තුවේ) කොස්ඉන්නේ පිහිටි මිල්ලගහකුඹුර යන ඉඩමෙන් පාර්චස් 08.6ක පමණ ඇති කොටසක්. ඊට මායිම් :—

උතුරට සහ බස්නාහිරට : මෙම ඉඩමේම ඉතිරි කොටස් ; නැගෙනහිරට : පී. ඇල්පේනිස් මුණසිංහ අයිතිකම් කියන මිල්ලගහකුඹුර ; දකුණට : මහවෙල ඇල.

(4) කොළඹ දිස්ත්‍රික්කයේ බටහිර සියනෑ කෝරළේ (මැදපත්තුවේ) කොස්ඉන්නේ පිහිටි ඔතුකුඹුර දවටගහකුඹුර යන ඉඩමෙන් පාර්චස් 24.25ක පමණ ඇති කොටසක්. ඊට මායිම් :—

උතුරට සහ බස්නාහිරට : මහවෙල ඇල ; නැගෙනහිරට : වෙල් ඇල ; දකුණට : මෙම ඉඩමේම ඉතිරි කොටස.

(5) කොළඹ දිස්ත්‍රික්කයේ බටහිර සියනෑ කෝරළේ (මැදපත්තුවේ) කොස්ඉන්නේ පිහිටි දවටගහකුඹුර යන ඉඩමෙන් පාර්චස් 3.3ක පමණ ඇති කොටසක්. ඊට මායිම් :—

උතුරට සහ බස්නාහිරට : මහවෙල ඇල ; නැගෙනහිරට : මෙම ඉඩමේම ඉතිරි කොටස ; දකුණට : වෙල් ඇල.

සී. පී. ද සිල්වා,
කෘෂිකර්ම හා ඉඩම් පිළිබඳ ඇමතිතුමා.

1959ක් වූ දෙසැම්බර් මස 10 වැනි දින
කොළඹදීය.

---

අංකය : කිව්. ඒ. 507/ජේ 58/59 එන් එස් 414.

## 1954රේ අඩක 39 දරණ සංශෝධිත පනතින් සංශෝධනය කළ පරිදි 1950හේ අඩක 9 දරන ඉඩම් ලබාගැනීමේ ආඥපනත

### 5 වැනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි

මෙහි පහත විස්තරකර තිබෙන ඉඩම් පොදු කටයුත්තකට උවමනා කර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1954 අඩක 39 දරණ සංශෝධිත පනතින් සංශෝධනය කළ පරිදි 1950හේ අඩක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 5 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ කෘෂිකර්ම හා ඉඩම් පිළිබඳ ඇමතිවරයාවූ මොහොට්ටාලලාගේ ඩිංගිරි බන්ඩා නමැති මම මෙයින් ප්‍රකාශකරමි :

කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරළේ පිලියන්දල නගර සභා සීමාව තුළ මාම්පේ ගම්මුලාදෑනි කොට්ඨාශයේ පිහිටි කැකුණගහවත්ත යන ඉඩමෙන් අක්කර 0, රූඩ් 0, පාර්චස් 22ක පමණ විශාලකම් ඇති ඉඩම් කෑබලි 2ක්.

1. පාර්චස් 20 පමණවූ කෑබැල්ලට මායිම් :—

උතුරට : මෙම ඉඩමේම කොටසක් (පාරට වෙන්කරන ලද අඩි 10යේ බිම් තීරුව) ; නැගෙනහිරට : ආරෝගයශාලා පාර ; දකුණට : (අත්පත් කර ගැනීමට යන) කැකුණගහවත්ත ; බස්නාහිරට : මෙම ඉඩමේම ඉතිරි කොටස.

2. පාර්චස් 2ක් පමණවූ කෑබැල්ලට මායිම් :—

උතුරට සහ නැගෙනහිරට : ඩබ්ලිව්. සිමියොන් ප්‍රනාන්දු සහ තව අය අයිතිකම් කියන කැකුණගහවත්ත ; දකුණට : (අත්පත් කර ගැනීමට යන) කැකුණගහවත්ත ; බස්නාහිරට : ආරොගයශාලා පාර.

ඇම්. ඩී. බන්ඩා,
කෘෂිකර්ම හා ඉඩම් පිළිබඳ ඇමතිතුමා.

1960ක් වූ මැයි මස 16 වැනි දින
කොළඹදීය.

---

අංකය : කිව්. ඒ 429/ජේ 57/58 ඇල්. ජී 502.

## 1954රේ අඩක 39 දරණ සංශෝධිත පනතින් සංශෝධනය කළ පරිදි 1950හේ අඩක 9 දරන ඉඩම් ලබාගැනීමේ ආඥපනත

### 5 වැනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි

මෙහි පහත විස්තරකර තිබෙන ඉඩම් පොදු කටයුත්තකට උවමනා කර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1954රේ අඩක 39 දරණ සංශෝධිත පනතින් සංශෝධනය කළ පරිදි 1950හේ අඩක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 5 වැනි වගන්තිය (1) වැනි උප වගන්තිය

යටතේ කෘෂිකම් හා ඉඩම් පිළිබඳ ඇමතිවරයාවූ මොහොට්ටාලලාගේ ඩිංගිරි බන්ඩා නමැති මම මෙයින් ප්‍රකාශකරමි:

කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරළේ ප්‍රාදේශීය ආදායම් කොට්ඨාශයේ කටුවාවල ගම්මුලාදෑනි කොට්ඨාශයේ, කටුවාවල පිහිටි නාගහවත්ත යන ඉඩමෙන් අක්කර 2ක පමණවූ ඉඩම් කෑබලි දෙකක්.

**(ඒ) අක්කර 1, රූඩ් 2, පර්චස් 29ක් පමණවූ කෑබැල්ලට මායිම්:—**

උතුරට: මෙම ඉඩමේම ඉතිරි කොටස; නැගෙණහිරට: බී. ඒ. මාතිස් පෙරේරා සහ තව අය අයිතිකම් කියන තල්ගහවත්ත සහ ඇම්. ඩී. කොර්නේලිස් සහ තව අය අයිතිකම් කියන තල්ගහ වත්ත නම්වූ රබර් ඉඩම; දකුණට සහ බස්නාහිරට: ඇස්. ඇස්. සිල්වා අයිතිකම් කියන නාගහවත්ත.

**(බී) අඩි 700 × 20ක් පමණවූ කෑබැල්ලට මායිම්:—**

උතුරට: කටුවාවල-ගොඩිගමුව ගම්සභා පාර; නැගෙණහිරට: පෝරගේ ජේම්ස් සහ තව කෙනෙක් අයිතිකම් කියන මීගහවත්ත යන ඉඩම; දකුණට: (ගැනීමට යන) මෙම ඉඩමේම ඉතිරි කොටස; බස්නාහිරට: මෙම ඉඩමේම ඉතිරි කොටස.

ඇම්. ඩී. බන්ඩා,
කෘෂිකම් හා ඉඩම් පිළිබඳ ඇමතිතුමා.

1960ක්වූ මැයි මස 3 වැනි දින
කොළඹදීය.

---

අංකය: කිප්‍රුඒ 558/ජේ58/59 ඊ 738

## 1954රේ අංක 39 දරණ (සංශොධිත) පනතින් සංශොධනය කළ පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් ලබා ගැනීමේ ආඥපනත

**5 වෙනි වගන්තිය යටතේවූ ප්‍රකාශයයි**

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම් පොදු කටයුත්තකට උවමනා කර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1954රේ අංක 39 දරණ (සංශොධිත) පනතින් සංශොධනය කළ පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 5 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ කෘෂිකම් හා ඉඩම් පිළිබඳ ඇමතිවරයාවූ මොහොට්ටාල්ලාගේ ඩිංගිරි බණ්ඩා නමැති මම මෙයින් ප්‍රකාශ කරමි:

කොළඹ දිස්ත්‍රික්කයේ උතුරු අළුත්කුරු කෝරළේ (බී) කොට්ඨාශයේ තම්මිට පිහිටි රූඩ් 3ක පමණ විශාලත්වය ඇති ගොරකගහ වත්ත නමැති මෙහි පහත සඳහන් අන්දමට මායිම් දක්වන ඉඩම:—

උතුරට: තම්මිට-කෙහෙල්බද්දර ගම්සභා පාර සහ තම්මිට ඇන්. ඒ. ජුසෙ අප්පුහාමි අයිතිකම් කියන ගොරකගහවත්ත; නැගෙනහිරට: තම්මිට එච්. ඒ. යොහානිස් අප්පුහාමි අයිතිකම් කියන ගොරකගහවත්ත; දකුණට: තම්මිට-කටුගස්තර ගම්සභා පාර; බස්නාහිරට: (රජය සතු) තම්මිට රජයේ පාසැල් ඉඩම.

ඇම්. ඩී. බණ්ඩා,
කෘෂිකම් හා ඉඩම් පිළිබඳ ඇමතිතුමා.

1960ක්වූ අප්‍රේල් මස 7 වැනි දින,
කොළඹදීය.

---

## 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශොධිත) ආඥපනතින් සංශොධනයවූ 1950හේ අඩක 9 දරණ ඉඩම් ලබා ගැනීමේ ආඥපණත

**5 වෙනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි**

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම පොදු කටයුත්තකට උවමනාකර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥපණතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශොධිත) ආඥපනතින් සංශොධනයවූ 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපණතේ (5) වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ කෘෂිකම් හා ඉඩම් පිළිබඳ ඇමතිවරයා වූ විජයානන්ද දහනායක නමැති මම මෙයින් ප්‍රකාශ කරමි:

ගාළු දිස්ත්‍රික්කයේ, හිනිදුම් පත්තුවේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ, බටුවන්ගල ගම්මුලාදෑනි වසමට අයත්, තඹලගම ගමේ පිහිටි, ඇල්ලාගවහේන නොහොත් නාවලහේන නමැති ඉඩමෙන්, පහත සඳහන් මායිම් තුළ වූ අක්කරයක් පමණ වූ බිම් කොටසක්.

උතුරට: ඩබ්ලිව්. ආර්. ද සිල්වා මයා. සහ ඩබ්ලිව්. ජෝන් සිල්වා මයා. අයිතිවාසිකම් කියන සිරිසුමන වත්ත; නැගෙනහිරට: පැලැල්ලබැන්ද ඇල; දකුණට: එම ඉඩමේම කොටසක්; බටහිරට: එම ඉඩමේම කොටසක් හා සිරිසුමන වත්ත.

ඩබ්ලිව්. දහනායක,
කෘෂිකම් හා ඉඩම් පිළිබඳ ඇමතිතුමා.

සඳහන් කළ යුතු අංකය:
ජේ. 58/59 ඊ 264/ඇල්ඒ. /ඒ. 170.

1960ක්වූ පෙබරවාරි මස 18 වැනි දින,
කොළඹදීය.

---

## 1954රේ අංක 39 දරණ ඉඩම් අත්කරගැනීමේ (සංශොධිත) ආඥපනතින් සංශොධිත 1950හේ අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ පනත

**5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය**

පහත විස්තර කරන ඉඩම මහජන කාය්‍යීයක් සඳහා අවශ්‍යයයි ද, එබැවින් එම පනතේ විධිවිධාන යටතේ එය අත්කර ගනු ලැබේ යයි ද කෘෂිකම් සහ ඉඩම් අමාත්‍ය විජයානන්ද දහනායක වන මම, 1954 අංක 39 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශොධිත) ආඥ පනතින් සංශොධිත, 1950හේ අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වෙනි වගන්තියේ (1) වෙනි උප වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශ කරමි:

ගාළු දිස්ත්‍රික්කයේ, තල්පෙ පත්තු ආදායම් නිලධාරි කොට්ඨාශයේ, උණවටුන නැගෙනහිර ගම්මුලාදෑනි වසමට අයත්, උනවටුන නමැති ගමේ පිහිටි, පරංගියවත්ත නමැති ඉඩමෙන්, පහත සඳහන් මායිම් තුළ වූ අක්කර ½ ක් පමණ වූ බිම් කොටස.

උතුරට: නැගෙනහිරට සහ බටහිරට එම ඉඩමේම කොටස්; දකුණට: ඕ. ඇලිස්නෝනා මහත්මිය අයිතිවාසිකම් කියන රේන්ද වත්ත.

ඩබ්ලිව්. දහනායක,
කෘෂිකම් හා ඉඩම් පිළිබඳ ඇමතිතුමා.

සඳහන් අංකය: ජේ. 58/59 ඊ 533/එල්. ඒ./ඒ. 185.

1960. 2. 18. දින
කොළඹදීය.

---

## 1954 අංක 39 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශොධිත) ආඥ පනතින් සංශෝධිත 1950හේ අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ පනත

**5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය**

පහත විස්තර කරන ඉඩම මහජන කාය්‍යීයක් සඳහා අවශ්‍යයයි ද, එබැවින් එම පනතේ විධිවිධාන යටතේ එය අත්කර ගනු ලැබේ යයි ද කෘෂිකම් හා ඉඩම් අමාත්‍ය මොහොට්ටාලගේ ඩිංගිරි බණ්ඩා වන මම, 1954 අංක 39 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශොධිත) ආඥ පනතින් සංශොධිත, 1950හේ අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වෙනි වගන්තියේ (1) වෙනි උප වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශ කරමි:—

යාපනය දිසාවේ, උතුරු වලිකාමම් ප්‍රාදේශයේ, අලවෙඩ්ඩි ග්‍රාමයේ පිහිටි ඉක්කිරානෙයි නැමැති ප්‍රමානයෙන් ලාච්චම්ස් 1, කැලිස් 15ක් පමනැති ඉඩමකි.

මෙම ඉඩමට මායිම් නම්:

උතුරින්: පාර හා ඒ. සිවගුරු සහ කේ. රාජදූරෙ හිමිකම් කියන ඉක්කිරානෙයි නැමැති ඉඩම; නැගෙනහිරින්: එස්. කතිරමලෙයි හා අයෙක් හිමිකම් කියන මංවඩි නැමැති ඉඩම; දකුණින්: නාගම්මා හිමිකම් කියන ඉක්කිරානෙයි නැමැති ඉඩම හා බට හිරින්: වී. නාඩේසු හා අයෙක් හිමිකම් කියන ඉක්කිරානෙයි නැමැති ඉඩමද වේ.

ඇම්. ඩී. බන්ඩා,
කෘෂිකම් හා ඉඩම් ඇමති.

මේ සම්බන්ධ ගොමු
අංකය: ජේ 59/60 වී 40

1960 මැයි මස 16 වනදා
කොළඹ දීය.

## 1954 අංක 39 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධිත) ආඥා පනතින් සංශෝධිත 1950හේ අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ පනත

### 5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

පහත විස්තර කරන ඉඩම මහජන කාර්‍යයක් සඳහා අවශ්‍යයයි ද, එබැවින් එම පනතේ විධිවිධාන යටතේ එය අත්කර ගනු ලැබේ යයි ද කෘෂිකර්ම හා ඉඩම් ඇමැති මොහොට්ටාලගේ ඩින්ගිරි බන්ඩා වන මම, 1954 අංක 39 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධිත) ආඥා පනතින් සංශෝධිත, 1950හේ අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වෙනි වගන්තියේ (1) වෙනි උප වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශ කරමි :—

යාපනය දිසාවේ, උතුරු වලිකාමම් ප්‍රාදේශයේ, මල්ලාකම් ග්‍රාමයේ පිහිටි තම්පිලාවත්තෙයි නැමැති අක්කර 0, රූ. 1, පර්. 10 ක් පමනැති ඉඩමකි.

මෙයට උතුරින් : ප්‍රසිද්ධ පාරක් ද; නැගෙනහිරින් : තංගරත්නම් හිමිකම් කියන තම්පලාවත්ත නැමැති ඉඩමද; දකුණින් : මාවතක් ද; බටහිරින් : එස්. ටී. විජයරත්නම් හිමිකම් කියන තම්පලාවත්ත නැමැති ඉඩමද මායිම්වේ.

ඇම්. ඩී. බන්ඩා,
කෘෂිකර්ම හා ඉඩම් ඇමති.

සඳහන් අංකය : ජේ 59/60 ඇස් 210.

1960 මැයි මස 14 වනදින,
කොළඹ දීය.

---

## 1950හේ අඩක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපණත

### 5 වැනි වගන්තිය යටතේ වූ ප්‍රකාශය

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම් පොදු කටයුත්තකට උවමනාකර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥා පණතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1950හේ අඩක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥා පණතේ 5 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යතැන වන මොහොට්ටලාගේ ඩිංගිරි බංඩා වන මම මෙයින් ප්‍රකාශකරමි :

යාපනය දිසාවේ, උතුරු වලිකාමම් ප්‍රාදේශයේ, කන්කසන්තුරේ සුළු නගර සභා සීමාව තුල 1 වන කොට්ඨාශයේ, පිහිටි පූතියන්පුතු කාඩු නැමැති ඉඩමෙන් අක්කර 0, රූ. 2, පර්. 10 ක් පමනැති කොටසකි. මෙය කීරිමලෙයි—කන්කසන්තුරේ පාරේ වරිපනම් අංක 134 දරන දේපලයි.

මෙම ඉඩමට මායිම් :—

උතුරින් : කීරිමලෙයි-කන්කසන්තුරෙ පාරද; නැගෙනහිරරින් : ආර්. සවුන්දරනායකී මහත්මිය හිමිකම් කියන කීරිමලෙයි-කන්කසන්තුරෙ පාරේ, වරිපනම් අංක 35 දරන දේපලද; දකුනින් : ඒ. අප්පාදුරෙයි මහත්මයා හිමිකම් කියන කීරිමලෙයි-කන්කසන්තුරෙ පාරේ, වරිපනම් අංක 17/8 දරන ඉලුප්පසියඩි නැමැති ඉඩම හා ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ ඉතිරි කැබිලිද; බටහිරින් : ටී. තේසම්මා මහත්මිය හිමිකම් කියන කීරිමලෙයි-කන්කසන්තුරෙයි පාරේ, වරිපනම් අංක 45 දරන ඉඩම.

ඇම්. ඩී. බන්ඩා,
කෘෂිකර්ම හා ඉඩම් ඇමති.

මේ සම්බන්ධ ගොමුව : ජේ 58/59 පී. 883

1960 මැයි මස 16 වනද,
කොළඹ දීය.

---

## 1954ජේ අංක 39 දරණ රජයට ඉඩම් ලබාගැනීමේ සංශෝධිත පණතින් සංශෝධනය කළ පරිදි වෂී 1950 අංක 9 දරණ රජයට ඉඩම් ලබාගැනීමේ පණත

### 5 වෙනි වගන්තිය යටතේ කරන ප්‍රකාශයයි

ගරු කෘෂිකර්ම හා ඉඩම් ඇමති තැන්පත් මොහොට්ටාල්ලාගේ ඩින්ගිරි බණ්ඩා වන මම, 1954 ජේ අංක 39 දරණ (සංශෝධිත) පණතින් සංශෝධනය කළ පරිදි, 1950හේ අංක 9 දරණ රජයට ඉඩම් ලබාගැනීමේ ආඥා පණතේ 5 වෙනි වගන්තියේ (1) වෙනි උප වගන්තිය යටතේ පහත විස්තර කරන ඉඩම පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය බවද එය එම වගන්තිය යටතේ ආණ්ඩුවට පවරා ගනු ලබන බවද ප්‍රකාශ කරමි.

වවුනියා දිස්ත්‍රික්කයේ වවුනියා දකුණු සිංහල ආදායම් පාලක කොට්ඨාශයේ, මාමඩුව ගම්මූලාදැනි වසම්කිය තුළ මහ කච්චකොඩියෙහි පිහිටි පන්සල ගොඩවෙල සහ කොටුවෙල කියන ඉඩමෙන් ප්‍රමාණයෙන් රූඩ් 2, පර්. 37ක්වූ පහත විස්තර කරන මායිම් තුළ පිහිටි බිම් කැබලි 8 ක්.

(1) **පන්සල් ගොඩවෙල—පර්චස් 02.2ක් පමණ.**

උතුරට : වන්නිහාමිගේ අප්පුහාමි අයිතිකම් කියන එම ඉඩමේම කොටසක් ; දකුණට සහ නැගෙනහිරට : ආණ්ඩුවේ ඉඩම ; බස්නාහිරට : එම ඉඩමේම ඉතිරි කොටස්.

(2) **පන්සල් ගොඩවෙල—පර්චස් 16.3ක් පමණ.**

උතුරට : යූ. පුන්චිරාල අයිතිකම් කියන එම ඉඩමේම කොටසක් ; නැගෙනහිරට සහ බස්නාහිරට : එම ඉඩමේම ඉතිරි කොටස ; දකුණට : ඒ. උඩයාරේ අයිතිකම් කියන එම ඉඩමේම කොටසක්.

(3) **පන්සල් ගොඩවෙල—පර්චස් 15.7ක් පමණ.**

උතුරට : කේ. පඤ්ඤාණන්ද තෙරුන් විසින් අයිතිකම් කියන එම ඉඩමේම කොටසක් ; නැගෙනහිරට සහ බස්නාහිරට : එම ඉඩමේම ඉතිරි කොටස ; දකුණට : ඩබ්ලිව්. අප්පුහාමි අයිතිකම් කියන එම ඉඩමේම කොටසක්.

(4) **පන්සල් ගොඩවෙල—රූඩ් 1, පර්චස් 11.5ක් පමණ.**

උතුරට : කේ, බණ්ඩා අයිතිකම් කියන කොටුවල නම් ඉඩම ; නැගෙනහිරට සහ බස්නාහිරට : එම ඉඩමේම ඉතිරි කොටස ; දකුණට : යූ. පුන්චිරාල අයිතිකම් කියන එම ඉඩමේම කොටස.

(5) **කොටුවෙල—පර්චස් 10.9ක් පමණ.**

උතුරට : කේ. මැණික්රාල අයිතිකම් කියන එම ඉඩමේම කොටස ; නැගෙනහිරට සහ බස්නාහිරට : එම ඉඩමේම ඉතිරි කොටස දකුණට : කේ. පඤ්ඤාණන්ද තෙරුන් අයිතිකම් කියන පන්සල ගොඩවෙල කියන ඉඩම.

(6) **කොටුවෙල—පර්චස් 11.3ක් පමණ.**

උතුරුට : කේ. ටිකිරිබණ්ඩා අයිතිකම් කියන එම ඉඩමේම කොටසක් ; නැගෙනහිරට සහ බස්නාහිරට : එම ඉඩමේම ඉතිරි කොටස ; දකුණට : කේ. බණ්ඩා අයිතිකම් කියන එම ඉඩමේම කොටස .

(7) **කොටුවෙල—පර්චස් 06.4 ක් පමණ.**

උතුරට : කේ. මැණික්රාල අයිතිකම් කියන එම ඉඩමේම කොටසක් ; නැගෙනහිරට සහ බස්නාහිරට : එම ඉඩමේම ඉතිරි කොටස ; දකුණට : කේ. මැණික්රාල අයිතිකම් කියන එම ඉඩමේම කොටස.

(8) **කොටුවෙල—පර්චස් 02.7 ක් පමණ.**

උතුරට සහ බස්නාහිරට : ආණ්ඩුවේ ඉඩම ; නැගෙනහිරට : එම ඉඩමේම ඉතිරි කොටස ; දකුණට : ටී. ටිකිරිබණ්ඩා අයිතිකම් කියන එම ඉඩමේම කොටසක්.

ඇම්. ඩී. බණ්ඩා,
කෘෂිකර්ම සහ ඉඩම් පිළිබඳ ඇමති.

අංකය : ජේ. 58/59 ඇල්. 794.

කොළඹ, 1960.4.7 දින.

---

## 1954 අංක 39 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධිත) ආඥා පනතින් සංශෝධිත 1950හේ අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ පනත

### 5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

පහත විස්තර කරන ඉඩම මහජන කාර්‍යයක් සඳහා අවශ්‍යයයි ද, එබැවින් එම පනතේ විධිවිධාන යටතේ එය අත්කර ගනු ලැබේ යයි ද කෘෂිකර්ම හා ඉඩම් ඇමැති මොහොට්ටාලගේ ඩින්ගිරි බන්ඩා වන මම, 1954 අංක 39 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධිත) ආඥා පනතින් සංශෝධිත, 1950හේ අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වෙනි වගන්තියේ (1) වෙනි උප වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශ කරමි :—

කුරුණෑගල දිස්ත්‍රික්කයේ වැ උඩ විල්ලි හත් පත්තුවේ වැ ගම පලාතේ පාදෙනිය නමැති ගමේ පිහිටි මහායායවත්ත නමැති ඉඩමෙන් (අංක 840 දරණ අ. ග. සි. 13 කැබැල්ලෙන් කොටසක්) පර්චස් 04 ක් පමණ ප්‍රමාණය ඇති පහත සඳහන් මායිම්තුල පිහිටි බිම් ප්‍රමාණය :—

උතුරට : ගල්ලැව ඇල ; නැගෙනහිරට, දකුණට සහ බස්නාහිරට : එකී ඉඩමේ ඉතිරි කොටස.

ඇම්. ඩී. බන්ඩා,
කෘෂිකර්ම හා ඉඩම් ඇමති.

3/61/21

සඳහන් අංකය : ජේ 59/60 ඇල් 308.

1960 මැයි මස 16 දින,
කොළඹ දීය.

## 1954 අඞක 39 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශොධිත) ආඥාපනතින් සංශොධිත 1950හේ අඞක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ පනත

### 5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

පහත විස්තර කරන ඉඩම් මහජන කායඝයක් සඳහා අවශ්‍යයයි ද, එබැවින් එම පනතේ විධිවිධාන යටතේ එය අත්කර ගනුලැබේ යයි ද කෘෂිකම් හා ඉඩම් ඇමැති මොහොට්ටාලගේ ඩින්ගිරි බණ්ඩා වන මම, 1954 අඞක 39 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශොධිත) ආඥාපනතින් සංශොධිත, 1950හේ අංක 9 දරණ ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වෙනි වගන්තියේ (1) වෙනි උප වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශ කරමි :—

1. කුරුණෑගල දිස්ත්‍රික්කයේ වැඋඩවිල්ලි හත්පත්තුවේ උඩ දිගන නමැති ගමේ පිහිටි අමුනගාව ලියද්ද නමැති ඉඩමෙන් අක්කර 0.09 ක් පමණ විශාලත්වයක් ඇති පහත සඳහන් මායිම්තුලවූ බිම් කට්ටිය :—

උතුරට : එකී ඉඩමේ ඉතිරි කොටස ; නැගෙනහිරට : රජය සතු ඇල සහ වැව් බැම්ම ; දකුනට : රජයසතු ඇල ; බස්නාහිරට : එච්. පී. උක්කුවා සහ තවත් අය හිමිකම් කියන වැබොඩ කුඹුර නමැති ඉඩම.

2.කුරුණෑගල දිස්ත්‍රික්කයේ වැඋඩ විල්ලි හත්පත්තුවේ උඩදිගන නමැති ගමේ පිහිටි වැබොඩ කුඹුර නමැති ඉඩමෙන් අක්කර 0.06 ක් පමණ විශාලත්වයක් ඇති පහත සඳහන් මායිම්තුලවූ බිම් කට්ටිය :—

උතුරට : එකී ඉඩමේ ඉතිරි කොටස ; නැගෙනහිරට : ඇස්. ඇම්. ගුණතිලක සහ තවත් අය හිමිකම් කියන අමුනගාව ලියද්ද නමැති ඉඩම : දකුනට : රජය සතු ඇල ; බස්නාහිරට : එකී ඉඩමේ ඉතිරි කොටස.

3. කුරුණෑගල දිස්ත්‍රික්කයේ වැඋඩ විල්ලි හත්පත්තුවේ උඩ දිගනේ පිහිටි කැත්ත නමැති ඉඩමෙන් අක්කර 0.11 ක් පමණ ප්‍රමානයක් ඇති පහත සඳහන් මායිම්තුල පිහිටි බිම් කට්ටිය :—

උතුරට: සහ බස්නාහිරට: එකී ඉඩමේ ඉතිරි කොටස; නැගෙනහිරට සහ දකුනට : ඇල ;

4. කුරුණෑගල දිස්ත්‍රික්කයේ වැඋඩ විල්ලිහත්පත්තුවේ උඩ දිගනේ නමැති ගමේ පිහිටි මැනුන් කුඹුර නමැති ඉඩමෙන් අක්කර 0.11ක් පමණ ප්‍රමානයක් ඇති පහත සඳහන් මායිම් තුල පිහිටි බිම් කට්ටිය

උතුරට සහ බස්නාහිරට : ඇල ; නැගෙනහිරට සහ දකුනට : එකී ඉඩමේ ඉතිරි කොටස.

5. කුරුණෑගල දිස්ත්‍රික්කයේ වැඋඩ විල්ලි හත්පත්තුවේ උඩ දිගනේ නමැති ගමේ පිහිටි මැනුන් කුඹුර නමැති ඉඩමෙන් අක්කර 0.13ක් පමන ප්‍රමාණයක් ඇති පහත සඳහන් මායිම්තුලවූ බිම් කට්ටිය :—

උතුරට, නැගෙනහිරට සහ දකුනට :එකී ඉඩමේ ඉතිරි කොටස් ; බස්නාහිරට : ඩී. පී. පින්චා සහ තවත් අය හිමි කම් කියන පරගහමුල කුඹුර නමැති ඉඩම.

6. කුරුණෑගල දිස්ත්‍රික්කයේ වැඋඩ විල්ලි හත්පත්තුවේ උඩ දිගනේ නමැති ගමේ පිහිටි පරගහ කුඹුර නමැති ඉඩමෙන් අක්කර 0.05ක් පමන ප්‍රමාණයක් ඇති පහත සඳහන් මායිම්තුල පිහිටි බිම් කට්ටිය:—

උතුරට සහ දකුනට :එකී ඉඩමේ ඉතිරි කොටස් ; නැගෙනහිරට : කොක් මහත්මිය සහ තවත් අය හිමි කම් කියන මිනුන් කුඹුර නමැති ඉඩම; බස්නාහිරට: කොක් මහත්මිය සහ තවත් අය හිමි කම් කියන ගලහිටියාව නමැති ඉඩම ;

7. කුරුණෑගල දිස්ත්‍රික්කයේ වැඋඩ විල්ලි හත්පත්තුවේ උඩ දිගනේ නමැති ගමේ පිහිටි ගලහිටියාව නමැති ඉඩමේන් අක්කර 0.06ක් පමන ප්‍රමානයක් ඇති පහත සඳහන් මායිම්තුල වූ බිම් කට්ටිය:—

උතුරට, දකුනට සහ බස්නාහිරට : එකී ඉඩමේ ඉතිරි කොටස් ; නැගෙනහිරට : ඩී. පී. පින්චා සහ තවත් අය හිමි කම් කියන පරගහමුලකුඹුර නමැති ඉඩම.

8. කුරුණෑගල දිස්ත්‍රික්කයේ වැඋඩ විල්ලි හත්පත්තුවේ උඩ දිගනේ නමැති ගමේ පිහිටි ඉහළගම වත්ත නමැති ඉඩමෙන් අක්කර 0.20 ක් පමන ප්‍රමාණයක් ඇති පහත සඳහන් මායිම්තුලවූ බිම් කට්ටිය :—

උතුරට : ඇල ; නැගෙනහිරට, දකුණට සහ බස්නාහිරට : එකී ඉඩමේ ඉතිරි කොටස.

ඇම්. ඩී. බණ්ඩා,
කෘෂිකර්ම හා ඉඩම් ඇමති.

සඳහන් අංකය : 3/61/42—ජේ59/60 ඇල් 163.

1960 මැයි මස 3 වැනි දින,
කොළඹදීය.

## 1954 අංක 39 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශොධිත) ආඥාපනතින් සංශොධිත 1950හේ අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ පනත

### 5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

පහත විස්තර කරන ඉඩම මහජන කායඝයක් සඳහා අවශ්‍යයයි ද, එබැවින් එම පනතේ විධිවිධාන යටතේ එය අත්කර ගනු ලැබේ යයි ද කෘෂිකම් සහ ඉඩම් අමාත්‍ය මොහොට්ටාල්ලාගේ ඩිංගිරි බණ්ඩා වන මම, 1954 අංක 39 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශොධිත) ආඥාපනතින් සංශොධිත, 1950හේ අඞක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වෙනි වගන්තියේ (1) වෙනි උප වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශ කරමි :—

කුරුණෑගල දිස්ත්‍රික්කයේ දඹදෙණි හත්පත්තුවේ පොල්ගහවෙල නගර සභා සීමාවේ අංක 4 දරණ කොට්ඨාශයේ පිහිටි වරිපනම් අංක 226/6 දරණ පවර් හවුස් පාරේ සාප්පුවේවත්ත නැමැති ඉඩමෙන් අ. 0, රූ. 2, ප. 19, පමණ විශාලත්වයක් ඇති පහත සඳහන් මායිම්තුල පිහිටි බිම් ප්‍රමාණය :—

උතුරට : ඇස්. ඇල්. ඇම්. සලීඩ් සහ තවත් අයට හිමි වරිපනම් අංක 22/5 22/5ඒ සහ 22/5බී දරණ පවර් හවුස් පාරේ පිහිටි සාප්පුවේවත්ත නැමැති ඉඩම ; නැගෙනහිරට රූබී දාසෙන් මහත්මියට අයිති කෑගල්ල පාරේ වරිපනම් අඞක 109/12 දරණ සාප්පුවේ වත්ත නැමැති ඉඩම ; දකුණට : දුම්රිය සංරක්ෂිත ඉඩම්—කෑගල්ල පාරේ පිහිටි වරිපනම් අඞක 109/24; බස්නාහිරට : ජේ. ඇස්. දාසෙන් මහත්මියට අයිති කෑගල්ල පාරේ වරිපනම් අංක 109/12 දරණ ස්වෛසත් විච් ඇස්වෛට් නැමැති ඉඩම සහ දුම්රිය සංරක්ෂිත ඉඩම.

ඇම්. ඩී. බණ්ඩා,
කෘෂිකම් සහ ඉඩම් ඇමති.

සඳහන් අංකය : 3/63/1—ජේ58/59 පී 175.

1960 අප්‍රේල් මස 3 දින,
කොළඹදීය.

---

## 1954 අංක 39 දරණ ඉඩම් අත්කරගැනීමේ (සංශොධිත) ආඥාපනතින් සංශොධිත 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනත

### 5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

පහත විස්තර කරන ඉඩම මහජන කායඝයක් සඳහා අවශ්‍යයයි ද, එබැවින් එම පනතේ විධිවිධාන යටතේ එය අත්කර ගනු ලැබේ යයි ද කෘෂිකම් සහ ඉඩම් අමාත්‍ය මොහොට්ටාල්ලාගේ ඩිංගිරි බණ්ඩා වන මම, 1954රේ අංක 39 දරණ ඉඩම් අත්කරගැනීමේ (සංශොධිත) ආඥාපනතින් සංශොධිත 1950හේ අංක 9 දරණ ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වෙනි වගන්තියේ (1) වෙනි උප වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශ කරමි :—

1. කෑගල්ල දිස්ත්‍රික්කයේ බෙලිගල් කෝරළේ දූදිගම ගමේ පිහිටි හත්ලාහ වැව හේන නමැති ඉඩමින් පර්චස් 06.0 පමණ වූ පහත සඳහන් මායිම්වලට මැදිවූ බිම් කොටස.

උතුරට : හත්ලාහවැවේහේන නමැති ඉඩම සහ ඒ. ඇල්. එස්. දූදිගම විසින් අයිතිකම් කියන දැනට රජයට අත්කර ගැනීමට යෝජිත දූදිගම වත්තේ කොටසක් ; නැගෙනහිරට සහ බස්නාහිරට : මෙම ඉඩමේ ඉතිරි කොටස් ; දකුණට : හත්ලාහ ඇල.

කෑගල්ල දිස්ත්‍රික්කයේ බෙලිගල් කෝරළේ, දූදිගම ගමේ පිහිටි දූදිගම වත්ත නමැති ඉඩමින් අ. 0, රූ. 1, ප. 16.5 ක් පමණවූ පහත සඳහන් මායිම්වලට මැදිවූ බිම් කොටස.

උතුරට, නැගෙනහිරට සහ බස්නාහිරට : මෙම ඉඩමේ ඉතිරි කොටස් ; දකුණට : දූදිගම වත්ත නමැති ඉඩම සහ ආර්. ඩබ්ලිව්. ඇම්. ලොකු මැණිකේ අයිතිකම් කියන (දැනට රජයට අත්කර ගැනීමට යෝජිත) හත්ලාහවැව හේන නමැති ඉඩමේ කොටසක්.

3. කෑගල්ල දිස්ත්‍රික්කයේ බෙලිගල් කෝරළේ, දූදිගම ගමේ පිහිටි දූදිගම වත්ත නමැති ඉඩමින් පර්චස් 21.5 ක් පමණවූ පහත සඳහන් මායිම්වලට මැදිවූ බිම් කොටස.

උතුරට : ආඳාගල මූකලාන නමැති ඉඩම සහ පී. පී. ඒ. 354 දරණ ප්ලෑනයේ බිම් කට්ටි අංක 4 ; නැගෙනහිරට සහ බස්නාහිරට : මෙම ඉඩමේ ඉතිරි කොටස් ; දකුණට : ඇල.

4. කෑගල්ල දිස්ත්‍රික්කයේ බෙලිගල් කෝරළේ, දූදිගම ගමේ පිහිටි දූදිගම වත්ත නමැති ඉඩමින් පර්චස් 18.0 පමණවූ පහත සඳහන් මායිම්වලට මැදිවූ බිම් කොටස.

උතුරට සහ දකුණට : ඇල සහ දූදිගම වත්ත නමැති ඉඩම ; නැගෙනහිරට සහ බස්නාහිරට : මෙම ඉඩමේ ඉතිරී කොටස්.

5. කෑගල්ල දිස්ත්‍රික්කයේ බෙලිගල් කෝරළේ දෑදිගම ගමේ පිහිටි දෑදිගම වත්ත නමැති ඉඩමින් අ. 0, රූ. 1, ප. 19.0. පමණවූ පහත සඳහන් මායිම්වලට මැදිවූ බිම් කොටස.

උතුරට සහ නැගෙනහිරට: මෙම ඉඩමේ ඉතිරි කොටස්; දකුණට: හොරොව්වෙවල මූකලාන නමැති ඉඩම සහ පී. පී. ඒ. 354 ප්ලෑනයේ අක්කර 6 දරන බිම්කට්ටිය සහ දෑදිගම වත්ත නමැති ඉඩම; බස්නාහිරට: ඇල සහ දෑදිගම වත්ත නමැති ඉඩම.

6. කෑගල්ල දිස්ත්‍රික්කයේ බෙලිගල් කෝරළේ දෑදිගම ගමේ පිහිටි දෑදිගම වත්ත නමැති ඉඩමින් පර්චස් 05.0 පමණවූ පහත සඳහන් මායිම්වලට මැදිවූ බිම් කොටස.

උතුරට: පී. පී. ඒ. 354 ප්ලෑනයේ බිම් කට්ටි අංක 6 සහ හොරොව්වේවල මූකලාන නමැති ඉඩම; නැගෙනහිරට: හොරොව්වේවල මූකලාන නමැති ඉඩම; දකුණට සහ බස්නාහිරට: මෙම ඉඩමේ ඉතිරි කොටස්.

ඇම්. ඩී. බණ්ඩා,
කෘෂිකර්ම සහ ඉඩම් ඇමති.

සඳහන් අංකය: ජේ 57/58 ඇල්. 304/ඇල්. ඇම්. 5718.

1960 මැයි මස 3 දින,
කොළඹදීය.

---

## 1954 අංක 39 දරණ ඉඩම් අත්කරගැනීමේ (සංශෝධිත) ආඥාපනතින් සංශෝධිත 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනත

### 5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

පහත විස්තර කරන ඉඩම මහජන කාර්යයක් සඳහා අවශ්‍යයයි ද, එබැවින් එම පනතේ විධිවිධාන යටතේ එය අත්කර ගනු ලැබේ යයි ද කෘෂිකර්ම සහ ඉඩම් අමාත්‍ය මොහොට්ටාල් ලාගේ ඩිංගිරි බණ්ඩා වන මම, 1954රේ අංක 39 දරණ ඉඩම් අත්කරගැනීමේ (සංශෝධිත) ආඥාපනතින් සංශෝධිත 1950හේ අංක 9 දරණ ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වෙනි වගන්තියේ (1) වෙනි උප වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශ කරමි:—

කෑගලු දිස්ත්‍රික්කයේ ගල්බොඩ හා කිණිගොඩ දෙකෝරළේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයෙහි පරපේ වසමේ පරපේ ගමේ පිහිටි වැලිගොඩලන් ද හේන නමැති ඉඩමෙන් අක්කර ½ක් පමණ විශාලත්වය ඇති කොටස. ඊට මායිම්:—

උතුරට: ඩබ්ලිව්. ඩී. කිරා අයිතිවාසිකම් කියන වැලිගොඩලන් ද නම් ඉඩම; නැගෙනහිරට: පරපේ කුඩා ඔය; දකුණට: ඊ. ඩී. සොබනා සහ තවත් අය අයිතිකම් කියන අම්බලම්මුල්ල තැන්න කුඹුර නම් ඉඩම; බස්නාහිරට: කෑග/පරපේ සිංහල මිශ්‍ර පාඨශාලා භූමිය (රජය සතු).

ඇම්. ඩී. බණ්ඩා,
කෘෂිකර්ම සහ ඉඩම් සංවර්ධන ඇමති.

සඳහන් අංකය: ජේ. 58/59 ඊ. 844.

1960 අප්‍රියෙල් මස 7 දින,
කොළඹදීය.

---

## 1954 අංක 39 දරණ ඉඩම් අත්කරගැනීමේ (සංශෝධිත) ආඥාපනතින් සංශෝධිත 1950හේ අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ පනත

### 5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

පහත විස්තර කරන ඉඩම මහජන කාර්යයක් සඳහා අවශ්‍යයයි ද, එබැවින් එම පනතේ විධිවිධාන යටතේ එය අත්කර ගනු ලැබේ යයි ද කෘෂිකර්ම සහ ඉඩම් අමාත්‍ය මොහොට්ටාල් ලාගේ ඩිංගිරි බණ්ඩා වන මම, 1954 අංක 39 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධිත) ආඥාපනතින් සංශෝධිත, 1950හේ අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වෙනි වගන්තියේ (1) වෙනි උප වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශ කරමි:—

කෑගලු දිස්ත්‍රික්කයේ ගල්බොඩ හා කිණිගොඩ දෙකෝරළේ කිරිවන්දෙණිය වසමේ කොටගම ගමෙහි පිහිටි පරගොඩවත්ත නම් ඉඩමෙන් අ. 0, රූ. 0, පර්. 2ක් විශාලත්වය ඇති කොටස, එයට මායිම්:—

උතුරට: සේදරගේ හිටිනාවත්ත නම් ඉඩම හා ගම්සභා පාර; නැගෙනහිරට හා බස්නාහිරට: එම ඉඩමේ ඉතිරි කොටස; දකුණට: එම ඉඩමේ ඉතිරි කොටස හා ගම්සභා පාර.

ඇම්. ඩී. බණ්ඩා,
කෘෂිකර්ම සහ ඉඩම් ඇමති.

සඳහන් අංකය: ජේ/59/60/එල්ජී. 35/ඇල්. ඇම්. 5840.

1960 මැයි මස 3 දින,
කොළඹදීය.

---

අංකය: කිප්‍ර. ඒ. 320.

## 1954 අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥාපනතින් සංශෝධිත 1950 අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ 31 බී වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

මෙහි පහත සඳහන් උප ලේඛනයේ විස්තර කරන ඉඩම් ආණ්ඩුවට අයත්කර ගැන්ම නිසා එකී ඉඩම් එකිනෙකට ගෙවනු ලබන පහත සඳහන් වන්දි මුදල් පහත සඳහන් උසාවියට ගෙවන ලද බවත්, ඒ සඳහා අයිතිකම් කියන යම් අයකු හෝ අයවලුන් වේ නම් ඒ ලබාගත යුතු බවත්, 1954 අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥාපනතින් සංශෝධිත, 1950 අඞක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ 31 වෙනි වගන්තියේ පරිදි කොළඹ රජයේ සහකාර දිසාපති වන මම මෙයින් දැනුම් දෙමි.

ජේ. ජේ. ජී. අම්ර්තනායගම්,
කොළඹ රජයේ සහකාර දිසාපති.

1960 ක්වූ මැයි මස 25 වෙනි දින,
කොළඹ දීය.

### උපලේඛනය

ඉඩම: සල්පිටිකෝරලේ එගොඩඋයන පාරේ පිහිටි නො. 304 දරණ ලංසියාවත්තෙන් කොටසක්; නො. ඒ 3,425 දරණ මූලික ප්ලෑනේ 5 වැනි කැබැල්ල; වන්දි මුදල: රු. 6.00; නඩුනොම්මරය: පානදුර දිස්ත්‍රික් උසාවියේ 539/ඇස්පීඇල්.

---

අංකය: කිව්. ඒ. 402.

## 1954 අංක 39 දරණ ආණ්ඩුවට ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධිත) ආඥාපනතින් සංශෝධනය කළ පරිදි 1950 අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනත

### 7 වැනි වගන්තිය යටතේවූ දැන්වීමයි

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස්කරන බැව් 1954රේ අංක 39 දරණ ආණ්ඩුවට ඉඩම් ඇතිකර ගැනීමේ (සංශෝධිත) ආඥාපනතින් සංශෝධනය කළ පරිදි 1950හේ අංක 9 දරන ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ 7 වැනි වගන්තියේ 1 වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම්දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර:—

මූලික ප්ලෑන් නො. ඒ. 4,412. ගම—වැතර

**කැබලි නො. 1.**

ඉඩමේ නම: අළුබෝගහකනත්ත වත්ත නොහොත් අළුබෝගහලන් ද; විස්තරය: අවුරුදු 30ක් පමණ වයසැති රබර් ගස් 381ක් ද, පොල් ගස් 2ක් සහ අවුරුදු 25ක් වයසැති ගොරක ගසකින් ද, අවුරුදු 8ක් වයසැති පුවක් ගසකින් ද යුත් ඉඩම; අයිතිකම් කියා සිටින අය: සියඹලාගොඩ පොල්ගස්ඕවිට ඇම්. ඒ. පෙරේරා සහ ඇම්. ලියනෝරා පෙරේරා යන මහත්මියන් සහ පොල්ගස්ඕවිට අබේසිංහ ආරච්චිගේ දොන් ජොහානිස් යන අයද අයිති වාසිකම් කියමින් ඉදිරිපත් වී ඇත; විශාලත්වය: අ. 2, රූ. 0, ප. 10.9.

ඉහත සඳහන් ඉඩමට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1960ක්වූ අගෝස්තු මස 3 වැනි දින පෙරවරු 11හේ වේලාවට කොළඹ කච්චේරියේදී මා සම්මුඛවිය යුතුයි.

තවද 1960ක්වූ ජූලි මස 27 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල සවභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිතවූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

ජේ. ජේ. ජී. අම්ර්තනායගම්,
කොළඹ දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ උප දිසාපති.

වෂී 1960ක්වූ මැයි මස 23 වැනි දින,
කොළඹ කච්චේරියේදීය.

---

අංකය: කිප්‍ර. ඒ. 417.

## 1954රේ අංක 39 දරණ (සංශෝධිත) පනතින් සංශෝධනය කළ පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනත

### 7 වැනි වගන්තිය යටතේවූ දැන්වීමයි

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව් 1954රේ අංක 39 දරණ සංශෝධිත පනතින් සංශෝධනය කළ පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ 7 වැනි වගන්තියේ 1 වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම්දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර :—

මූලික සිතියමේ නො. ඒ. 4,462, ගම—පැලියගොඩ-ගඟකබොඩ (කොටසක්)

**කැබැල්ල : 1.**

ඉඩමේ නම : නුවරපාරේ වරිපනම් නො. 63 කොටසක් වූ මල්වත්ත සහ බෙලි ගහවත්ත ; විස්තර : අවුරුදු 60ක් වූ පොල්ගස් 4යි, අවුරුදු 30ක් වූ සල්ගස, අවුරුදු 15ක් වූ කොස්ගස, පුලුන්ගසක්, උගුරැස්ස ගසක්, නම්නන් ගසක්, අවුරුදු 5ක පුවක් ගස් 3ක්, දොඩම් ගසක්, ළිඳක් සහ කරත්ත පාරක කොටසක් ඇති ඉඩම ; අයිතිකම් කියන අය : ඩී. ඇෆ්. ජේ. පෙරේරා, පෙරකදෝරු මහතා, දළුගම, කැලණිය ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 18.7.

**කැබැල්ල : 2.**

ඉඩමේ නම : නුවර පාරේ පිහිටි වරිපනම් නො. 83, 87, 89, 91, 97 සහ 79/1, කොටසක් වූ මල්වත්තේ ගොඩකුඹුර ; විස්තර : අවුරුදු 30ක් වූ පොල්ගසක් සහ සියඹලාගසක්, අවුරුදු 5ක් වූ පැපොල් ගසක්, මාස 6වූ කෙසෙල් පඳුරක්, උළුසෙවිලි කළ ගොඩනැගිල්ලක් සහ ගොඩනැගිල්ලක කොටසක් කපරාදු කළ ලිං දෙකක්, වැසිකිළියක්, ගබඩාකාමරයක කොටසක් ඇති තණකොළ ඉඩම ; අයිතිකම් කියන අය : ඇස්. ඇස්. මුණසිංහ සහ ඇම්. ඇන්. මුණසිංහ 25, පෙයාර්ෆීල්ඩ් ගාඩ්න්ස්, බොරැල්ල, ඇල් කේ. මුණසිංහ, 17, කොනිස්ටන් පෙදෙස ; කොළඹ 7 : සියලුදෙනාම නො. 53/1, ග්‍රෙගරි පාරේ පදිංචිව සිටි නැසීගිය ඇල්. මුනසිංහ මහත්මියගේ සහ ඒ. රොඩ්රිගු මහත්මියගේ උරුමක්කාරයෝ ; ප්‍රමාණය : අ. 0, රූ. 1, ප. 09.2.

**කැබැල්ල : 3.**

ඉඩමේ නම : නුවරපාරේ පිහිටි වරිපනම් නො. 100න් කොටසක් වූ බංගලාවත්ත ; විස්තර : ඉඩම ; අයිතිකම් කියන අය : පී. රාමනාදන් තෙල්මෝල, පැලියගොඩ ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 05.0.

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම, තමන් හෝ ඔවුන් ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1960ක් වූ අගෝස්තු මස 3 වැනි දින පෙරවරු 10යේ වේලාවට කොළඹ කච්චේරියේ දී මා සම්මුඛවිය යුතුයි.

තවද 1960ක් වූ ජූලි මස 27 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල සවභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිතවූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

ජේ. ජේ. ජී. අමිර්තනායගම්,
කොළඹ දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ උප ඒජන්තතුමා.

වෂී 1960ක් වූ මැයි මස 23 වැනි දින,
කොළඹ කච්චේරියේ දීය.

---

අංකය : කිපු. ඒ 492

## 1954රේ අංක 39 දරණ (සංශොධිත) පනතින් සංශොධනය කළ පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනත

**7 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි**

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව් 1954රේ අංක 39 දරණ සංශොධිත පනතින් සංශෝධනය කළ පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 7 වැනි වගන්තියේ 1 වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම්දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර :—

මූලික සිතියමේ නො. ඒ 4,465. ගම—වත්තල

**කැබැල්ල : 1.**

ඉඩමේ නම : මිල්ලගහවත්ත මීගමු පාරේ වරිපනම් නො. 368/1, දරණ ඉඩමේ කොටසක් ; විස්තර : අවුරුදු 50ක් වූ පොල්ගස් 5ක් ඇති පොල් ඉඩම ; අයිතිකම් කියන අය : මේරි ජෝන්පුල්ලේ මහත්මිය, " සෙන්ට් පීටාස් " වත්තල ඞී. ඇල්. ජයසුන්දර මහත්මිය, දළුගම, කැලණිය සහ සී. ඒ. වී. ජයසුන්දර මහත්මිය, ඉහළ කරගහමුන, කඩවත ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 33.4.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් 1960 අගෝස්තු මස 11 වැනි දින පෙරවරු 11ට කොළඹ කච්චේරියේ දී මා සම්මුඛවිය යුතුයි.

තවද 1960 අගෝස්තු මස 4 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිතවූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

ජේ. ජේ. ජී. අමිර්තනායගම්,
කොළඹ දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ උප ඒජන්තතුමා.

වෂී 1960ක් වූ මැයි මස 23 දින
කොළඹ කච්චේරියේ දීය.

## 1954 රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශොධිත) ආඥපනතින් සංශොධනය කරන ලද පරිදි 1950හේ අඞක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනත

**7 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි**

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව් 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශොධිත) ආඥපනතින් සංශොධනය කරන ලද පරිදි, 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 7 වැනි වගන්තියේ (1) වනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම්දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර :—

නො. ඒ. 4,405. ගම : මූකලන්ගමුව.

**කැබැල්ල 1.**

ඉඩමේ නම : ගොරකගහවත්ත හෙවත් හල්ගහ වත්ත විස්තර : අවුරුදු 30ක පොල්ගහක්, අවුරුදු 8ක මුරුංගාගහක්, අවුරුදු 8ක පුවක්ගහක් ඇති ඉඩම ; අයිතිවාසිකම් කියන අය සහ ලිපිනය : ජයසිංහ ආරච්චිගේ පබිලිස් සිල්වා, ජයසිංහ ආරච්චිගේ සලමන් සිල්වා, ජයසිංහ ආරච්චිගේ පිලිප් සිල්වා, මූකලන්ගමුව, සීදුව ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 00.7.

**කැබැල්ල 3.**

ඉඩමේ නම : ගොරකගහවත්ත හෙවත් හල්ගහවත්ත ; විස්තරය : අවුරුදු 40ක පොල්ගස් හතරක්, අවුරුදු 12ක පුවක්ගස් 8ක් සහ ස්ථිර ගොඩනැගිල්ලක කොටසක් ඇති ඉඩම ; අයිතිවාසිකම් කියන අය සහ ලිපිනය : කෝවිලගේ මර්තේලිස් සිල්වා, මූකලන්ගමුව, සීදුව ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 05.3.

**කැබැල්ල නො : 4.**

ඉඩමේ නම : ගොරකගහවත්ත ; විස්තරය : තාවකාලික ගොඩනැගිලි 4ක් ඇති ඉඩම ; අයිතිවාසිකම් කියන අය සහ ලිපිනය : ජයකොඩි ආරච්චිගේ දෝන මේරි මාගරට්, "ද රෝසරී", මූකලන්ගමුව, සීදුව ; ජයකොඩි ආරච්චිගේ දොන් ඇල්බට්, මූකලන්ගමුව, සීදුව ; ප්‍රමාණය : අ. 0, රූ, 1, ප, 02.1.

**කැබැල්ල නො : 5.**

ඉඩමේ නම : ගොරකගහවත්ත ; විස්තර : අවුරුදු 10 ක පොල්ගහක් ඇති ඉඩම ; අයිතිවාසිකම් කියන අය සහ ලිපිනය ; ජයකොඩි ආරච්චිගේ දෝන මේරි මාගරට්, "ද රෝසරී", මූකලන්ගමුව, සීදුව ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 01.5.

**කැබැල්ල නො : 6.**

ඉඩමේ නම : දවටගහවත්ත ; විස්තර : අවුරුදු 10 ක පොල්ගස් 2 ක්, අවුරුදු 70 ක පොල්ගස් 2 ක්, අවුරුදු 10 ක අඹගහක්, සහ ලාවුළු ගහක් ඇති ඉඩම ; අයිතිවාසිකම් කියන අය සහ ලිපිනය : ජයකොඩි ආරච්චිගේ දෙන් අන්තනී, මූකලන්ගමුව, සීදුව ; ප්‍රමාණය : අ. 0, රූ. 1, ප. 04.0.

**කැබැල්ල නො : 7.**

ඉඩමේ නම : දවටගහවත්ත ; විස්තර : අවුරුදු 60 ක පොල්ගස් 4ක්, අවුරුදු 14ක පොල්ගහක්, අවුරුදු 8ක කජු ගහක් සහ තාවකාලික ගොඩනැගිල්ලක් ඇති ඉඩම ; අයිතිවාසිකම් කියන අය සහ ලිපිනය : බොතලගේ ලිලියන් ප්‍රනාන්දු, මූකලන්ගමුව, සීදුව ; ප්‍රමාණය : අ. 0, රූ. 1, ප. 01.6.

**කැබලි නො : 8.**

ඉඩමේ නම : දවටගහවත්ත ; විස්තරය : අවුරුදු 50 ක පොල්ගස් 20 ක්, අවුරුදු 20 ක පොල්ගස් 12 ක්, අවුරුදු 5 ක දෙහිගස් 2 ක්, දොඩම් ගස් 2 ක්, අවුරුදු 20 කොහොඹගහක්, අවුරුදු 50 ක ගොරකගහක්, කපරාරු කළ ළිඳක් සහ ස්ථිර ගොඩනැගිල්ලක් ඇති ඉඩම ; අයිතිවාසිකම් කියන අය සහ ලිපිනය ; දෙහිවලගේ වින්සන්ට් පෙරේරා, පෙරියමුල්ල මාකට්, මීගමුව ; අ. 0, රූ. 2,. ප. 06.6.

**කැබලි නො ; 9.**

